


# "සමාධි" බැති ගී

වෙසක් කාලයට ලංකාවෙදි වගේම පිටරටවල්වල ඉන්න අපේ අයත් පින් අතේ කටයුතු බොහොම කරනවා. ප්‍රතිපත්ති පූජා වගේම ආමිස පූජාවලටත් උනන්දුවෙන අය බොහෝමයි. වෙසක් කාලේ ඉදිරිපත් කරන බැති ගීත මේ අතරින් විශේෂයි. " ගී සඳළුව"ට අරන් එන ගීත කලාව ගැන ලියන-කොට බැති ගී ගැනත් ලියන්න වෙනවා. මෙහේ බොහෝ වෙලාවට බැති ගී විදියට පිරිසක් එකතු වෙලා ගායනා කරන්නේ කලින් අපට මාධ්‍යවලින් අහන්න ලැබුණ ගීත. ඒත් අළුත්ම ගීත ලියලා, සංගීතය නිර්මාණය කරලා ගායනා වෙන වෙලාවලුත් තියෙනවා. දහම් පාසැල්වල, ඉස්කෝලවල ඉගෙන ගන්න දරුවන්ව වෙසක් කාලෙට මේ ගායනා වෙනුවෙන් ගීත නිර්මාණය කරලා පුහුණු කරවන්නේ ගුරුවර ගුරුවරියන්.

මේ විදියට අළුතෙන්ම නිර්මාණය වුණ ගීත තුනක් මේ වෙසක් කාලයේ මෙල්බර්න් නුවර පුරා විහාරස්ථානවල අහන්න ලැබුණා. ඒ සමාධි බැති ගී සරණියෙන්. අවුරුදු දහයකට විතර ඉස්සර පටන් ගත්ත මේ බැති ගී ගායනාව මේ වසරේ පැවැත්වුනේ හත්වෙනි වතාවට. ඉතින් එදා - මෙදා තුර මේ ගීත සරණිය මෙහෙයවපු කොලින් පල්ලියගුරු මහත්මයාව අපි ගී සඳළුවට කැඳෙව්වා.

"සිංහල පූජා සේවා සංගමය තමයි මුලින්ම මේ භක්ති ගීත ගායනය පටන් ගත්තේ. රමනි ලියනාරච්චි මහත්මිය තමයි මේ වැඩේට මුල පිරුවේ." කොලින් අප හා පිළිසඳරට එක් වුණා. අප අතරින් මීට වසර හත අටකට ඉස්සරදී වෙන් වුණ ලියනාරච්චි මහත්මිය මෙල්බන් හි විසූ ප්‍රකට සමාජ සේවිකාවකි.

"පස්සේ අපි "සමාධි" කියන නමින් සංවිධානය වුණා. එදා ඉඳලා අද වෙනකල් අපිත් එක්ක ඉන්න හේමා ජයරත්න මහත්මයාව මුලින් ම මතක් කරන්න ඕන. ඒ වගේම අපට සංගීතයෙන් උදව් කරන ඒ මහත්තමයගේ පුතා, සජිත්වත් මේ වෙලාවෙ මතක් වෙනවා. තිරානි පහළවත්ත මහත්මිය අපට කවදත් පිරිස එක්කරලා දෙමින්, ගීත හොයලා තෝරලා දෙමින් උදව් කරන කෙනෙක්." අප ගායනාවන්ට සහභාගිවෙන පිරිස ගැන විමසිලිමත් වුණා.

"ඇත්තට ම බැළුවොත් එදා - මෙදා තුර අපිත් එක්ක ගායනාවලට සම්බන්ධ වුණ කට්ටිය සීයක් විතර වෙනවා. තම තමන්ගේ වැඩ පළ, කාර්ය බහුලකම එක්ක සමහර අය අයින් වෙනවා. ආයෙත් එකතු වෙනවා. මේ පාර තමයි වැඩිම දෙනෙක් අපි එක්ක භක්ති ගීත ගායනා කළේ. ගැහැණු පිරිමි දෙගොල්ලම 27 දෙනෙක් අපිට එකතු වුණා.

මේ පාර විශේෂත්වය තමයි අපේම ගීත තුනක් අපි නිර්මාණය කරපු එක. ඒ ගැන ඉතින් මම විස්තර කරන්න ඕන නැහැනේ..." කොලින් පල්ලියගුරු මහත්මයා හිනා වුණා.

සාමාන්‍යයෙන් පන්සලක් ගීත ගායනය ඉවර වුණාම නායක ස්වාමීන් වහන්සේ කෙටි ධර්මදේශනයක් කරනවා. පහුගිය අවුරුද්දේ ඩැංඩිනොං ධම්ම දීප භාවනා මධ්‍යස්ථානයේ භක්ති ගීත ගායනා කළාට පස්සේ අකරවිට සංඝානන්ද ස්වාමීන්වහන්සේ අගේ ඇති යෝජනාවක් ගෙනාවා:

"මේ සිසිර මහත්තයලත් ඉන්න එකේ අළුත් සින්දුවක් දෙකක් හදාගෙන කිව්වොත් මොකද ? හැමදාම පරණ සින්දු කියනවට වඩා වෙනසක් වේවි නේද ?"

ඒ වගේම කීස්බරෝ ධම්ම සරණ විහාරයේ නාඹටුන්නේ විජිත නායක ස්වාමීන් වහන්සේත් ඒ යෝජනාවම ගෙනාවා....

"ලබන අවුරුද්දේ අපිට අළුත් සින්දුත් අහන්න ලැබෙයි කියලා හිතනවා....."

විජිත ස්වාමීන් වහන්සේ ගීත රචනයටත් හපන්. ඉතින් උන්වහන්සේ අතින් සරළ සුගම පදවලින් ලියවුන බුදු ගුණ ගීතයත් මුලින්ම අළුත් ගීතයක් විදියට නිර්මාණය වුණා. තනුවයි සංගීතයයි අසංග ලියනගේ මහත්තයාගේ. අසංග ලංකාවේදී ආචාර්ය ප්‍රේමසිරි කේමදාස මහත්තයාගේ සංගීත කටයුතුවලට අවුරුදු ගණනාවක් තිස්සේ දායක වුණ තරුණයෙක්.

ලංකාවේ ප්‍රවීන් ගීත රචකයෙක් වුණ සුනිල් සරත් පෙරේරා මහත්තයා ටික කාලයක් මෙල්බන් වල හිටියා. ඒ වෙලාවේ ඒ මහත්තයාගෙනුත් ගීතයක් ඉල්ලාගන්න හේමා ජයරත්න මහත්තයා අමතක කළේ නෑ. සංදේශ කාව්‍ය වල එහෙම ලියැවිලා තියෙන වියත් සිංහල භාෂාවෙන් තමයි සුනිල් සරත් පෙරේරා මහත්තයා ගීතය ලියලා තියෙන්නේ. ගීතයට තනුව හදලා සංගීතවත් කළේ විශාරද තිලකා කුලතුංග මහත්මිය. ඒ මහත්මියත් ලංකාවේ සංගාතාචාර්යවරියක් විදියට සෑහෙන කාලයක් පළපුරුද්ද තියෙන මහත්මියක්. ඒ නිසාම ගීතවට තනුව හැදුනේ උත්තර භාරතීය සංගීතයේ " භෛරවි" රාගය මුල් කරගෙන. ඔය ගීත දෙකම බුදු ගුණ ගීත විදියට ලියැවිලා තිබුණේ.

ඉතින් කොලින් මහත්තයා අපට කරපු ආරාධනාව සළකලා වෙනම විදිහේ පද ටිකක් ලියලා දෙන්න කල්පනා කළා. මෙල්බන් පරිසරයට ගැලපෙන්න, "යාර නදිය", "වොබටන් අරණ" වගේ දේවල් ඇසුරින් සමාධි බැති ගී සරණිය අසා සිටින්නට පිළිගන්වන ගීතයක් ලිව්වොත් හොඳයි කියලා හිතුවා. එදා නේරංජනා ගඟේ දියට එක් වුණ බොදු දම් සඳ දියමයි බුදු හිමි සිරි ලක වැඩි දා ඉඳලා සිරිපා අරණින් ඉනූ ගංගා දියවරට අඳත් එක්වන්නේ. ඒ බොදු දම් සඳ දියමයි අද මෙල්බන් නුවර යාර නදියට එක් වන්නේත්. ඉතින් දිය දෝතක් ගෙන අසන, නරඹන පිරිසට ඉසිනවා වාගේ මි බැති ගී සරණිය ඉදිරිපත් කරනවා ය කියන අදහසි ලිව්වේ. මේ ගීතයට තනුව සංගීතය නිර්මාණය කළේ අතුල ලෙව්කේ බණ්ඩාර මහත්තයා. ලංකාවේ වෘත්තිය මට්ටමින් ගායන ශිල්පියෙකු විදියට සංගත තැටි පවා නිකුත් කළ අතුල ලෙව්කේ බණ්ඩාර වාදනයටත් හපනෙක්.

මේ වාරේ භක්ති ගී ගායනයට වාදනයෙන් දායක වුණේ විශාරද තිලකා කුලතුංග, අතුල ලෙව්කේ බණ්ඩාර, අසංග ලියනගේ. කොලින් පල්ලියගුරු එක්ක රෝහිත වැල්මිල්ලගේ මහත්ම මහත්මීන්. තිලකා සිතාරයත්, අතුල බේස් ගිටාරයත්, අසංග සර පුවරුවත්, කොලින් තබ්ලාවත්, රෝහිත ගිටාරයත් වාදනය කළා. මේ හැමෝටම අනිත් භාණ්ඩත් වාදනය කරන්න පුලුවන්.




රැකී රක්ෂාවලට හිරවෙලා අවිවේකීව ඒකාකාරීව කාලය ගතකරන අපට මේ ගීත පුහුණු වෙනකොටත් ගායනා ඉදිරිපත් කරනකොටත් දැනෙන්නෙ හරි සැනසීමක්. ඒ වගේම වෙනසක්. දුර බැහැර පන්සල්වල ගායනා කරන්න එකම බස් එකේ යන ගමනක් විනෝද චාරිකාවක් වගේ. ඒත් එතකොටනම් ගායනා කරන්නෙ භක්ති ගීත විතරක් ම නෙවි. වෙනස් කාලේ භක්ති ගීත ගායනාවලින් පස්සෙ කණ්ඩායම එකතුවෙලා පවත්වන සාදය ගැනත් කියන්න තියෙන්නෙ ඒ ටිකම තමා.

කාගෙවත් හිත් රිද්දන්නෙ නැති මේ වාගේ දේවල්වලට දායක වෙන්න ලැබෙන එක සතුටක්. අනික් අයත් මේ දේවල්වලින් මොහොතකට හරි සතුටක්, සැනසීමක් ලබනවානම් ඒකත් හරි සතුටක්. ආමිස පූජාවක් හැටියට පිනකුත් අත් වෙනවා. මේ දේවල් කරන්න හිතක්, හයියක් ලබා දුන්න දෙමව්පියන්ටත්, ගුරුවර ගුරුවරියන්ටත් ඒ පින් අත්වේවි.

## මේ උතුම් පෝය දා

මේ උතුම් පෝය දා - බෝධි මණ්ඩලේ උඩින්
තරු දහස් පිරිවරා - චන්ද්‍රණ මණ්ඩලේ දිලේ

සව් කෙලෙස් නැසූ උතුම් - බුදු රදාණන් වඳිමි
චන්ද්‍රස මණ්ඩලෙන් පුදා - මේ උතුම් පෝය දා

මේ උතුම් පෝය දා - හිමිදිරි උදෑසනින්
ස්වර්ණ වර්ණ කිරණ දී - පෙර දිගින් හිරු නැගේ

පාරමී දම් පිරූ - බුදු රදුන් පුදන්නෙමි
සූර්ය මණ්ඩලෙන් පුදා - මේ උතුම් පෝය දා

මේ උතුම් පෝය දා - තුරු ලතාවන් පුරා
මල් පිපී ගෙඩි ඉදී - ලස්සනයි මිහිතලේ

දම් දියෙන් ලොව දෙවූ - දම් රදුන් පුදන්නෙමි
මහා මිහිකතින් පුදා - මේ උතුම් පෝය දා

**ගී පද- පූජ්‍ය නාඹටුන්නේ විජිත නායක ස්වාමින් වහන්සේ**
**තනුව සහ සංගීතය- අසංක ලියනගේ**

## යාරා නදියේ

යාරා නදියේ සඳ දිය දිය වී
මුදු රැළි සැනහේ මේ වෙසගේ
වොබටන් යායේ සඳ දිය නැහැවී
ළා පත් ළෙළ දේ මේ වෙසගේ
පින් බිම මතුයේ බොදු සිත් පේවී
දම් හඬ පැතිරේ මේ වෙසගේ
මෙල්බන් පුරයේ සමාධි බැති ගී
සරණිය ගයමුව මේ වෙසගේ

දෙදහස් හයසිය වසරක් පුරලා
නේරංජාවේ ගැලූ දියේ
බුදු හිමි සිරිලක වැඩි දා ඉඳලා
සිරි පා අරනින් ඉනූ දියේ
දිය වූ බොදු සඳ දියවර ගලලා
රැළි සැනැහේ දැන් යාරා දියේ
ඒ සිහිලැල් දිය දෝතක් පුරලා
ඉසිමුව සතහට මේ වෙසගේ

**රචනය - සිසිර දිසානායක**
**තනුව සහ සංගීතය - අතුල ලේව්කේ බණ්ඩාර**




## අවමඟුල් දැන්වීමය්

උපත 1907



විපත 2013

මාතර වල්ගම වැස අපවත් වූ විදාන කංකානමලාගේ පිනෝරිස් මහතාගේ ඇඹනියන් වූත් - අපවත් වූ ප්‍රේමතිස්ස, සෝමබන්ධු, ආරියබන්ධු යන අයගේ මෑනියන් වූත් - මාතර වල්ගම විසූ දෝන ප්‍රන්සිනා ධීරරත්න මාතාවෝ 106 වසක් ආයු වළඳ 2013 මැය් 24 වැනිදා (වෙසක් පෝ දා) ඇහිලිවැවේ හඳපානගල දී අපවත් වූහ.

අවසන් කටයුතු 26 වැනිදා - ඉරිදා ඇහිලිවැවේ හඳපානගල පවිලේ සොහොන් බිමේ දී සිදු කරන බව දැනුම් දෙන්නේ

| | | |
|---|---|---|
| වී. ක. ධර්මබන්ධු | - | පුතා |
| වී.ක. පද්මබන්ධු | - | පුතා |
| වී.ක. සුනිල්බන්ධු | - | පුතා |
| වී.ක. නන්දා | - | දුව |
| වී.ක. සරත් සෝමබන්ධු- | | මුනුබුරා |
| ර.මු. ප්‍රේමලතා | - | මිනිබිරි |